සැ.යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2017 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,033 - 2017 අගෝස්තු මස 18 වැනි සිකුරාදා - 2017.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1454 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1459 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - සුකියෝ මහිකරි ශ්‍රී ලංකා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 සැප්තැම්බර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## කළුතර නගර සභාව

කළුතර නගර සභාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු වෙනුවෙන් මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (කළුතර නගර සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනට මෙම සභාවේ ආදේශක, කොන්ත්‍රාත් හෝ ව්‍යාපෘති පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.)

| අනු. අංකය | සේවා ශ්‍රේණිය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන කාර්යාල කාර්ය සහායක 111 ශ්‍රේණිය | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙක(02) ක් සහිතව විෂයයන් හය (06) ක් සමත්වීම (මින් විෂයයන් 05 ක් එකවර සමත්විය යුතුයි.) | | රු. 24,250-250x10-270x 10-300x10-330x12-රු.36,410 PL1 - 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ. (එහිදී අධ්‍යාපන සුදුසුකම්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය සලකා බැලේ. ඊට අමතරව තනතුරට හිමි පෞරුෂත්වය සලකා බැලේ.) |
| 02. | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන වැඩ / ක්ෂේත්‍ර කම්කරු 111 ශ්‍රේණිය | 05 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුයි. | | රු. 24,250-250x10-270x 10-300x10-330x12-රු.36,410 PL1 - 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ. (එහිදී පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවා කර ඇති සේවා කාලය තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය සලකා බැලේ.) |
| 03. | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සෞඛ්‍ය කම්කරු 111 ශ්‍රේණිය | 02 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුයි. | | රු. 24,250-250x10-270x 10-300x10-330x12-රු.36,410 PL1 - 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ. (එහිදී පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවා කර ඇති සේවා කාලය තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය සලකා බැලේ.) |

| අනු අංකය | සේවා ගණය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනිම |
|---|---|---|---|---|---|---|
| 04 | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය රියදුරු 111 | 02 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හය (06) ක් සමත් විය යුතුයි. (එක් වාරයක දී අවම වශයෙන් විෂයයන් 05 (පහ) ක් සමත් විය යුතුයි.) | පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයාගේ සහතිකයක් ලබා තිබිය යුතුයි. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන්, සී, සහ සී 1, වාහන පංතියේ බලපත්‍රයක් නව රියදුරු බලපත්‍රය අනුව, බී, පංතියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුයි.)<br>මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුයි.<br><br>***පළපුරුද්ද***<br>රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රියදුරකු වශයෙන් වසර තුන (3)ක පළපුරුද්දක් තිබිය යුතුයි. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුයි. | රු. 25,790-270x10-300x10-330x10-350x12-රු.38,990<br><br>PL3 - 2016 | වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ. වෘත්තීය පරීක්ෂණයේ දී පහත අංක පිළිබඳ සලකා බැලේ.<br>1. රිය පැදවීමේ නිපුණත්වය<br>11. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>111. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| 05 | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය විදුලි කාර්මික 111 | 01 | I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් හය (6) ක් සමත් වී තිබීම. මින් විෂයයන් පහ (5) ක් එක් වරක දී සමත්වී තිබිය යුතුයි.<br>සහ<br>II. තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. | වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම;<br>හෝ<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළ එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළ එක් වසරකට නොඅඩු | රු. 25,790-270x10-300x10-330x10-350x12-රු. 38,990<br><br>PL3 - 2016 | ඉහත සුදුසුකම් ඇති අයදුම්කරුවන් අතරින් අභ්‍යන්තර අයදුම්කරුවන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබන කුසලතාවය මත පුරප්පාඩු පුරවනු ලැබේ.<br><br>එසේ අභ්‍යන්තර සේවකයන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවල දී දක්වා ඇති සුදුසුකම් සපුරන |

| අනු. අංකය | සේවා ශ්‍රේණිය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|
| | | | (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.) | පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම *හෝ ;* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරයේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; *හෝ* ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; *හෝ* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. | | බාහිර අයදුම්කරුවන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබා ගන්නා කුසලතාවය මත පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ. |

***02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :***

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නව වසර තුනක (03) කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iii) කළුතර නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(v) කළුතර නගර සභාවේ දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් ලෙස සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

(vi) අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(vii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය.

(viii) රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතු ය.

(ix) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

(x) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා ඉහලම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(xi) එක් එක් තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලු අවම සුදුසුකම් ගැසට් පත්‍රයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(xii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර, කාල සීමාවේදී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම් වෙනස් කිරීම් හා මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර නගර සභාවේ ලේකම් සතුය.

***03. සේවයේ නියුක්ත කිරීමේ පොදු කොන්දේසි :***

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

(iv) තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් සඳහා 2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුව වේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

(v) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝග වලට ද දෙපාර්තමේන්තු නියෝගවලට කළුතර නගර සභාව විසින් වරින්වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

***04. අයදුම් කළයුතු ආකාරය :***

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ 4 ප්‍රමාණයේ ) අයදුම්පත් සකස් කර අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහල කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2017.09.02 දිනට පෙර, "ලේකම්, කළුතර නගර සභාව, කළුතර", යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනටමත් රජයේ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් එවිය යුතුය :-**

(i) උප්පැන්න සහතිකය
(ii) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්
(iii) අධ්‍යාපන සහතික/පාසැල හැර යාමේ සහතිකය
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කල පදිංචිය සනාථ කිරීමේ සහතිකය
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය
(vii) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්
(viii) පොලිස් වාර්තාව

05. පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට/ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එම කැඳවීම ලද පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කළුතර නගර සභාවේ ලේකම් සතු වන්නේය.

ගීතානි ඩී ලොකුවැල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්‍ය්‍ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර නගර සභාව.

2016 අගෝස්තු මස,
කළුතර නගර සභා කාර්යාලයේ දී ය.

**කළුතර නගර සභාව**

----------------------------- *තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

01. (i) මුල'කුරු සමග නම :——————————————.
(ii) මුල'කුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
02. ස්ථිර ලිපිනය :——————————————.
03. ග්‍රාම නිලධාරි කොට්ඨාශය :——————————————.
04. දිස්ත්‍රික්කය :——————————————.
05. උපන්දිනය:අවුරුද්ද :————— මාසය :————— දිනය :—————
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2017.09.02) වයස :
අවු :————— මාස :————— දින:—————
07. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
08. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යනවග :——————————————.
09. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
10. දුරකථන අංකය :——————————————.
11. විවාහක/අවිවාහක බව :——————————————.
12. පළමු පත්වීම් දිනය :——————————————.
13. අධ්‍යාපන සුදුසුකම් :-

13.1 අයදුම්කරුවන් අවසන්වරට සමත්වූ පන්තිය :——————————————.

13.2 අ.පො.ස. ( සා.පෙළ ) විභාගය :
(i) වර්ෂය:————— මාසය :—————
(ii) විභාග අංකය:—————
(iii) ප්‍රතිඵල :-

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. අ.පො.ස. (උ.පෙළ) විභාගය :
(i) වර්ෂය:————— මාසය :—————
(ii) විභාග අංකය:—————
(iii) ප්‍රතිඵල :-

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

15. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————————.

16. වෙනත් සුදුසුකම් :——————————————.

17. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? නැතිද? යන වග :—————

18. ඔබ දැනටමත් මෙම නගර සභාවේ ස්ථිර, ආදේශක, අනියම්, තාවකාලික, ව්‍යාපෘති පදනම යටතේ සේවය කරන්නේ ද? එසේ නම් එම සේවා කාලය හා විස්තර :——————————————.

19. තනතුර :——————————————.

20. සේවා කාලය : අවුරුදු :————— මාස:————— දින:—————

21. ගතවූ වසර 05 තුල විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද? :——————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත්වන බවද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

---------------- මහතා / මහත්මියගේ මෙම ආයතනයේ -------------------------------- වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, ඔහු ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන..

දිනය :————— .

08-857

---

# පළාත් පාලන නිවේදන

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විශේෂ විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය යටතේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ විස්තර කර ඇති මංමාවත් නැවත නම් කරනු ලබන බව මෙයින් නියෝග කරනු ලැබේ.

ජේ. එම්. නිමල් ජයසිංහ,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභා ලේකම්,

2017 ජූලි මස 26 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

| | | |
|---|---|---|
| පළාත් පාලන ආයතනයේ නම | ඃ- | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව |
| දිස්ත්‍රික්කය | ඃ- | කුරුණෑගල |
| 01. වීථියේ වර්තමාන නාමය | ඃ- | නාරංගහමුල වත්ත මාර්ගය |
| අළුතින් යොදා ඇති නාමය | ඃ- | ඩී. ටී. මාගිරිස් අප්පුහාමි මාවත |
| මාර්ග විස්තරය | ඃ- | මෙම මාවත කොළඹ කුරුණෑගල ප්‍රධාන මාර්ගයෙන් ආරම්භව නාරංගහමුල වත්ත, ගොරොක්ගහපොත්ත සහ කෝන්වත්ත යන ග්‍රාමයන් සඳහා ප්‍රවිෂ්ඨ වන මාර්ගයේ කුඩාඔය පාලම දක්වා දිග මීටර 200ක් වන මාර්ගය. |

08-687

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් අප ලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

#### මාර්ග නාම ලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *ආවසානය* | *වම් පස පදිංචිකරුවන්* | *දකුණු පස පදිංචිකරුවන්* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|
| 1 | මීවතුර අතුරු මාර්ගය (බෝගහගොඩ හේන) | B-12 විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ නිල නිවස ඉදිරියෙන් | මීවතුර දුම්රිය මාර්ගය අසල | ඩී.එම්.ටී.බී. දිසානායක<br>වයලට් කස්තුරිආරච්චි<br>එල්.ආර්.බී. රණසිංහ<br>එල්.කේ.සී. රණසිංහ<br>එල්.ආර්.එස්.ඩී. බණ්ඩාර<br>ආර්.ඇම්.අර්ජුන බණ්ඩාර | ඩී.එම්.එම්. දිසානායක<br>එච්.එම්. තිලක් රණතුංග<br>ආර්.එම්.කාන්ති රත්නායක<br>ඒ. වේලුසාමි<br>වයි.එම්. සුමිත් රත්නායක<br>එස්. මානෙල් රත්නායක<br>ඩබ්.එම්.ජේ.බී.ටී.වික්‍රමසිංහ | අඩි 600 | අඩි 08 |

08-624

---

## රජ්ගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2017.06.29 වැනි දින තීරණ අංක 1258 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයවර්ධන ගමාච්චිගේ වීරසේන,
ලේකම්,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2017 ජූලි මස 10 වැනි දින,

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ/හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම පහසුකිරීමත් සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වන සහ 5 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කරගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයන ලෙසට නියම කළ යුතු යැයි, රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.".

08-686

---

## චාවකච්චේරි නගර සභාව

1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව චාවකච්චේරි නගර සභාව විසින් 2017.07.17 වැනි දින චාවකච්චේරි නගර සභාව පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කා.සණ්මුගතාසන්,
ලේකම්,
චාවකච්චේරි නගර සභාව.

2017 ජූලි මස 24 වැනි දින,
චාවකච්චේරි,
චාවකච්චේරි නගර සභා කාර්යාලයේ දී ය.

**2017.07.17 වැනි දින අංක 48 දරන තීරණය**

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2016.02.02 වැනි දින අංක 1952/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ උතුරු පළාතේ පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින ස්ථිර කරන ලද 2017.03.24 වැනි දින අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දූ වූ ද, නගර සභාවල සම්මත අතුරු ව්‍යවස්ථා අංක 1 සිට අංක 6 දක්වා වූ කොටස්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා, මේ තීරණය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ චාවකච්චේරි නගර සභාව තීරණය කරන්නී ය.

08-626

---

## සූරියවැව ප්‍රාදේශීය සභාව

අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් සූරියවැව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2012.08.17 දින සූරියවැව ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් සම්පාදනය කළ අංක 520/7 දරන 1988 අගෝස්තු 23 දිනැති අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දා වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කර පිළිගත්තා වූ ද, සම්මත අතුරු ව්‍යවස්ථාවල පළමු හා දෙවන කොටසේ 1 සිට 42 දක්වා වූ පොදු අතුරු ව්‍යවස්ථාවලට අදාල අංක 21 වගන්තිය වන අප්‍රසන්න හා අන්තරායදායක වෙළඳාම් යටතේ උපලේඛන (i), (ii), (iii) සඳහන්

ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් 2016.10.11 වැනි දින පැවැති මුදල් හා ප්‍රතිපත්තිකාරක සභාවේ දී නිර්දේශ කරන ලදුව 2016.10.12 වන දින තීරණ අංක 10/20 යටතේ මා විසින් එය අනුමත කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. කරුණාරත්න,
ලේකම්,
සූරියවැව ප්‍රාදේශීය සභාව.

2016 ඔක්තෝබර් මස 12 වැනි දින,
සූරියවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

(i) *අප්‍රසන්න ව්‍යාපාර :*

01. කිරි ආහාර නිෂ්පාදනය කිරීමේ ස්ථාන.
02. කුකුළු ගොවිපළ.
03. වාහන සර්විස් කිරීමේ ස්ථාන.
04. හුණු හා ගඩොල් පෝරණු.
05. බලවේග පෙහෙකම්හල්.
06. සත්ත්ව ගොවිපළ.
07. වී මෝල්.
08. ත්‍රිරෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
09. කෘෂිකාර්මික යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
10. යතුරුපැදි හා පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
11. ලියවන පට්ටල් වැඩ.
12. මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
13. ඇඹරුම්හල්.
14. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථාන.
15. ගවගාල්.
16. අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථාන.

(ii) *අන්තරායදායක ව්‍යාපාර :*

01. ගල්වලක් පවත්වාගෙන යාම.
02. යන්ත්‍රානුසාරයෙන් කැටගල් නිෂ්පාදනය කිරීමේ ස්ථාන.
03. කෘෂිරසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන.
04. වෙල්ඩින් වැඩපල.
05. ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා විකිණීම.
06. ගෑස් විකිණීම.
07. අබලි ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ විකිණීම.
08. ෆයිබර් ග්ලාස් නිෂ්පාදනය හා විකිණීම.
09. ඉලෙක්ට්‍රික් වැඩපළ.
10. කෘෂි ආම්පන්න නිෂ්පාදනය කිරීම.
11. කොන්ක්‍රීට් වැඩපළ.
12. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.

(iii) *අප්‍රසන්න හා අන්තරායදයක ව්‍යාපාර :*

01. ගරාජ්.
02. ලී මෝල්.
03. පොහොර විකිණීමේ ස්ථාන.
04. යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ මෝල්.
05. වායු සමීකරණ හා ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථාන.
06. වඩුමඩු.
07. කම්මල්.
08. බැටරි චාජ් කිරීමේ ස්ථාන.
09. පෙරමුසු තාර මිශ්‍ර කිරීමේ යන්ත්‍රය පවත්වාගෙන යාම.
10. කොන්ක්‍රීට් මිශ්‍රණාගාරයක් පවත්වාගෙන යාම.
11. රසායනාගාර පහසුකම් සැපයීමේ ස්ථාන.
12. දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම.
13. පොල්කටු අඟුරු නිෂ්පාදනය කර විකිණීමේ ස්ථාන.

08-556

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 පෙබරවාරි මස 17 දින අංක 2,007 දරන පළාත් සභා *ගැසට් පත්‍ර* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍රය* මගින් ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, එම ගැසට් නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දනුම් දී ඇත.

එහෙත් එම කාලසීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකර නොමැති බැවින්, එකී ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී පහත උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරි ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | මාර්ගයේ නම | පටන්ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | දිග | පළල | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | දෙවට පාර (ග්‍රාම නිලධාරි වසම දෙහිදෙණිය නැගෙනහිර) | පුවක්ගහ කුඹුර (රේණුකා ගීතානි නිවස අසලින්) | ප්‍රගති මාවත දක්වා | 01. ඩබ්. ජී. එන්. ජයසේකර<br>02. රේණුකා ජී. ද සිල්වා<br>03. මානෙල් සිල්වා<br>04. අයි. ඩී. සී. නිරෝෂි<br>05. එල්. ජී. සමන්<br>06. එල්. ජී. පී. ජයන්ත<br>07. කේ. ජී. ඉන්ද්‍රානි ජයසේකර | 01. අනුර බණ්ඩාර<br>02. හර්ෂ විජේකෝන්<br>03. එස්. කේ. රත්නායක<br>04. කේ. එම්. ටී. බණ්ඩාර<br>05. පී. ජී. ඩී. ප්‍රියශාන්ත<br>06. ඩී. ඒ. ජී. ධම්මික | මී. 100 | මී. 1.8 | 2016/174 |
| 02 | දෙල්දෙණිය අඹගස්තැන්න පාර (ග්‍රාම නිලධාරි වසම දෙල්දෙණිය) | දෙල්දෙණිය | ගලපිටමඩ වත්ත | 01.ජී. යූ. සීලවතී<br>02.එස්. ජී. ඩබ්. ගුණරත්න<br>03.කේ. වයි. රණවීර<br>04.ඩී. මාලගම්මන<br>05.පී. ඩබ්. ජිනේන්ද්‍රදස<br>06.පී. ඩබ්. ජේ. ජයවර්ධන<br>07.පී. ඩබ්. සී. ජයවර්ධන<br>08.එන්. අබේසිංහ | 01. එස්. සමරනායක<br>02. ඕ. මාලගම්මන<br>03. එන්. අබේසිංහ<br>04. කේ. දිසානායක<br>05. යූ. ජී. ප්‍රියන්ති<br>06. එල්. ගුණවර්ධන | මී. 258.80 | මී.2.43 | 2232/ඒ |

08-553

---

**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව පොල්ගහවෙල ප්‍රාදේශීය සබාවේ ලේකම්, ජයසිංහ මුදියන්සේලාගේ නිමල් ජයසිංහ වන මම නිවාස දේපළ සංවර්ධන හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2017.06.30 දිනැති තීරණ අංක 994 දරන තීරණ යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. එම්. නිමල් ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2017 ජූලි මස 24 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වය පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2003.11.28 වන දින අංක 1317 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබුවා වූ වයඹ පළාතේ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා එකී ගැසට් නිවේදනය පරිච්ඡින්න කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ 2014.10.01 දින හා 1882/22 අංකයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා එකී *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 2015.01.20 වැනි දින හා 1898/28 අංකයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදළ සංශෝධන හා 2014.10.01 දිනැති අංක 1882/22 දරන (අති විශෙෂ) *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළවූ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කරමින් 2015.08.28 වැනි දින හා 1929/45 අංකයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදළ සංශෝධන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගනත්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

08-666

---

**මහරගම නගර සභාව**

නගර සභා ආඥපනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥපනතේ 255 වන අධිකාරිය 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම මහසභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

ලේකම් හා සභාවේ බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහරගම නගර සභාව.
ලේකම් (වැ. බ.)

| *අනු. අංකය* | *සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *උපලේඛනය අනුව සීමාවන්* |
|---|---|---|---|---|---|
| 01 | සැ.අ. 5184<br>දිනය : 2008.01.05 | දෙපානම සමගි මාවත 2 වන පටුමග | අඩි 489-0<br>අඩි 87-0 | අඩි 20-19<br>අඩි 15-0 | උතුරට : පුද්ගලික ඉඩම<br>දකුණට : සමගි මාවත<br>බටහිරට : පුද්ගලික ඉඩම<br>නැගෙනහිරට : පුද්ගලික ඉඩම |

08-667

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.